*සැ. යු.* — (i) 2015.05.22 දින පළ වූ අංක 1,916 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.
(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2012 වර්ෂයේ ජුනි සිට සැප්තැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.



# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,917 - 2015 මැයි මස 29 වැනි සිකුරාදා - 2015.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)



## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 842 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 842 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |



**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 ජුනි මස 19 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 ජුනි මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


841- B 80952— 5,302 (2015/05)
F 1 -

# පළාත් සභා නිවේදන

## දකුණු පළාත් අධ්‍යාපන, ඉඩම් හා ඉඩම් සංවර්ධන මහා මාර්ග සහ ප්‍රවෘත්ති අමාත්‍යාංශය

### 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනතේ 6 (1) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2(1) "අ" ඡේදයේ අර්ථ නිරූපනය අනුව, දකුණු පළාත් ඉඩම් හා ඉඩම් සංවර්ධන විෂය භාර ගරු චන්දිමා රාසපුත්‍ර අමාත්‍යතුමා විසින් (1969 අංක 16, 1981 අංක 27, 1993 අංක 22, 1995 අංක 19 සහ 1996 අංක 20 දරන ඉඩම් සංවර්ධන (සංශෝධිත) පනත්වලින්) සංශෝධිත 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥාපනතේ 6 (1) වගන්තිය යටතේ මෙහි පහත උපලේඛනයේ විස්තර දැක්වෙන නිලධාරීන් ඔවුන්ගේ රාජකාරිවලට අමතර වශයෙන් 2012.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉඩම් නිලධාරීන් ලෙස පත් කර තිබේ.

වයි. වික්‍රමසිරි,
ලේකම්,
අධ්‍යාපන, ඉඩම්.... අමාත්‍යාංශය,
දකුණු පළාත.

2015 අප්‍රේල් මස 09 වැනි දින.

*උපලේඛනය*

| *අනු. අංකය* | *නිලධාරියාගේ නම* | *අනුයුක්ත කාර්යාලය* | *පත්කර ඇති පළාත* |
|---|---|---|---|
| 01 | කෝරලේගේ විලානි රුක්මාලි | සහකාර ඉඩම් කොමසාරිස් කාර්යාලය, ගාල්ල | දකුණු පළාත |
| 02 | මාබොටුවන ජාගොඩගේ දොන් කෝෂල චමින්ද කිත්සිරි | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කඩවත්සතර - ගාල්ල | දකුණු පළාත |

05-650

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආධුනික හෛසජ්ජක තනතුර (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015

වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආධුනික හෛසජ්ජක තනතුර (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමට පහත සඳහන් සුදුසුකම් ලත් වයඹ පළාතේ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. මෙම විභාගය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කුරුණෑගල නගරයේ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කෙරේ. විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට බලය ඇත.

02. *වැටුප් ක්‍රමය.-* රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 6/2006 (iv) අනුව MT 2/2006 A

රු. 14,570 - 10 x 170-11 x 180-6x 240 -14 x 320 - රු. 24,170

03. *(අ) අධ්‍යාපන සුදුසුකම්.-* සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය/අංක ගණිතය, විද්‍යාව/සෞඛ්‍ය විද්‍යාවට සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් ඇතුළුව සම්මාන 04ක් සහිතව එක් වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී නව විෂය නිර්දේශය යටතේ ජීව විද්‍යාව සහ රසායන විද්‍යාව ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් (03) ද, පැරණි විෂය නිර්දේශය යටතේ නම් උද්භිද විද්‍යාව හා රසායන විද්‍යාව ඇතුළුව විද්‍යා විෂයයන් තුනකින් (03) ද එකවර සමත් වී තිබීම.

ඉහත අධ්‍යාපන සුදුසුකම් 2015.06.30 දිනට සම්පූර්ණ කර සහතික ලබා තිබිය යුතු ය.

*(ආ) වෙනත් සුදුසුකම්.-*

(i) වයස් සීමාව අවුරුදු 18ට නොඅඩු හා 30ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුතු වූවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(iii) අයදුම්පත් කැඳවන දිනට වයඹ පළාත් සභා බල ප්‍රදේශය තුළ වසර 03කට නොඅඩු කාලයක් සඳහා ස්ථිර පදිංචියක් තිබිය යුතු ය. (ස්ථිර පදිංචිය අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරනු ලබන පදිංචි සහතිකයක් විසින් සනාථ කළ යුතු ය.

(iv) යහපත් චරිතයකින් යුක්ත අයෙකු විය යුතු ය.

(v) *ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා.-* තනතුරට පත් කිරීම සඳහා තෝරාගනු ලැබූ අයදුම්කරුවන් දේශීය වෛද්‍ය විද්‍යාලයේ දෑ අවුරුදු හෛසජ්ජක පුහුණු පාඨමාලාව හදාරා සහතිකපත් ලැබ හෛසජ්ජක වරයෙකු ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි විය යුතු ය.

ඉහත අධ්‍යාපන සුදුසුකම් සපුරාලනු ලදුව විවෘත තරග විභාගයෙන් සමත්වූවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය කරනු ලබන අතර, එහිදී තෝරා ගනු ලබන අයදුම්කරුවන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ආධුනික හෛසජ්ජක තනතුරට (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගනු ලැබේ. මෙසේ බඳවාගනු ලබන අය දේශීය වෛද්‍ය විද්‍යාලයේ දෑ අවුරුදු හෛසජ්ජක පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා යොමු කරනු ලැබේ. එම පාඨමාලාව හදාරනු ලබන කාල සීමාව තුළ දී ඔවුනට රු. 12,360 ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ.

(vi) ඉහත සඳහන් හෛසජ්ජක පාඨමාලාව සාර්ථකව හදාරා නියමිත වෘත්තීය සුදුසුකම් සපුරන ලද ආධුනික හෛසජ්ජකවරුන් වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කරන ලද දින සිට ක්‍රියාත්මක වන පරිදි MT 2/2006A වැටුප් පරිමාණයේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවනු ලැබේ.

04. *සේවා කොන්දේසි.-*

(i) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ, අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.

(ii) මෙම තනතුරට පත් කරනු ලබන්නන් තුන් වසරක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර ඔහු/ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ සහ හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවෙනි කාර්යක්ෂමතා කඩඉම් පරීකෂණය සමත් ව තිබේ නම් හා අනෙකුත් අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවය ස්ථිර කරනු ලැබේ.

(iii) ආයතන සංග්‍රහයේ I වන බණ්ඩයේ II වැනි පරිච්ඡේදයේ 10 සිට 12 දක්වා වූ ඡේදවල විධිවිධාන තනතුරට ගැළපෙන පරිදි අදාළ වනු ඇත.

(vi) මෙම තනතුර සඳහා වූ බඳවා ගැනීමේ/උසස් කිරීමේ පරිපාටියේ රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසි වලට ද, දෙපාර්තමේන්තු නියෝග වලට ද, පළාත් මුල්‍ය රීති සංග්‍රහය, පළාත් විනය කාර්ය සංග්‍රහය ද රාජ්‍ය හා වයඹ පළාත් සභාව විසින් නිකුත් කර ඇති හා වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව ක්‍රියා කිරීමට සියළුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය.-* පුරප්පාඩු සංඛ්‍යාවට වඩා අඩු අයදුම්පත්‍ර සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති විට සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ඉදිරිපත් වී ඇති විට වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන විභාගයක ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. පුරප්පාඩු තනතුරු සංඛ්‍යාවෙන් 70% ක් මෙම විභාගයේ ප්‍රතිඵල මත පුරවනු ලැබේ. විභාග විෂය නිර්දේශයේ දැක්වෙන එක් එක් ප්‍රශ්න පත්‍රයට 40% ක් හෝ ඊට වැඩියෙන් ලකුණු ලබා ගත් අයදුම්කරුවන් තෝරා ඔවුන්ගේ ලකුණු ප්‍රමුඛතා ලේඛනයක් සකස් කරනු ලැබේ. එම ලේඛනයේ අනුපිළිවෙල අනුව හා පුරප්පාඩු සංඛ්‍යාව මත සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දීමක් සිදු නොකෙරේ.)

06. *විභාග පරිපාටිය.-*

| *විෂයයන්* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| සාමාන්‍ය දැනීම | පැය 02 | 100 |
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 |

*සටහන :*

(i) සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාවය හා හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් කර ඇත.

(ii) සෑම ලිඛිත උත්තර පත්‍රයක් සම්බන්ධයෙන් නොපැහැදිලි අත් අකුරු සහ අක්ෂර වින්‍යාස දෝෂ වෙනුවෙන් ලකුණු අඩු කරනු ලැබේ.

(iii) ඉහත එක් එක් විෂයන්ට අවම වශයෙන් 40% ක් වත් ලකුණු ලබා ගත යුතු ය. කුසලතා අනු පිළිවෙල සහ පවත්නා පුරප්පාඩු ප්‍රමාණය අනුවම පත් කිරීම් කරනු ලැබේ.

(iv) *විභාගයට පෙනී සිටිය යුතු මාධ්‍ය.-* අපේක්ෂකයින්ට සිය මනාපය පරිදි එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකිය.

07. විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන පරිදි තමුන් පදිංචි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලෙසද ව. ප. ස. මු. /2 ලදුපත අයදුම්පතට අමුණා එවිය යුතුය. එසේ මුදල් ගෙවා ලබාගත් ලදුපත් හැර වෙනත් ආයතනවලට ගෙවා ලබාගත් ලදුපත් හෝ මුදල් ඇණවුම් භාරගනු නොලබන අතර, කුමන හේතුවක් නිසා හෝ ගෙවූ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව සැළකිය යුතුය.

08. *ඉල්ලුම් කළ යුතු පිළිවෙල.-*

8.1 මෙම නිවේදනයේ අග ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව ඒ4 ප්‍රමාණයේ (සෙ. මී. 21/29) කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත සකස් කර ගත යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත් "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා ලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ, "වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආධුනික හෛසජ්ජක තනතුර (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015" යනුවෙන් සඳහන් කළ යුතුය.

8.2 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

8.3 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති, නිසි ලෙස තොරතුරු ඇතුළත් නොකල, අසම්පූර්ණ හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. තව ද සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතියට අනුකූල ද යන්න පිළිබඳව විමසා බැලීම අයදුම්කරු සතු වගකීමකි. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරු විසින්ම දරා ගත යුතු ය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

09. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2015.06.30 වේ.

10. මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා නොමැති අයගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා මෙම සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල ලිපි ලේඛනවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය. සෑම අයදුම්කරුවෙක්ම තනතුරට අදාල සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

11. *අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය.-* අපේක්ෂකයින් තමා පෙනී සිටින සෑම විෂයයක් සඳහාම තම අනන්‍යතාවය පහත සඳහන් ලියවිලි වලින් විභාග ශාලාධිපති ට තහවුරු කළ යුතු ය.

(1) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත,
(2) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සටහන.-* විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපේක්ෂකයින් අපොහොසත් වුවහොත් ඔවුන් විභාගයට පෙනී සිටීම සඳහා නුසුදුස්සන් ලෙස සලකනු ලැබේ.

12. කිසියම් අපේක්ෂකයෙකුට සිය ප්‍රවේශ පත්‍රය විභාගයට යටත් පිරිසෙයින් දින 07 කට පෙර නොලැබුනහොත් ඒ බව වහාම "ලේකම්, වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය කුරුණෑගල" යන ලිපිනයට දැන්විය යුතුයි. එසේ දැනුම් දීමේ දී පහත විස්තර ඉදිරිපත් කළ යුතු ය.

*(අ)* විභාගයේ නම :————.
*(ආ)* අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :————.
*(ඇ)* ලිපිනය :————.
*(ඈ)* අයදුම්පත්‍රය යොමු කළ ලිපිනය, ලියාපදිංචි තැපෑලේ අංකය හා දිනය :————.

13. යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව පත්වීම් ලැබීමට පෙර ඕනෑම අවස්ථාවක අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසු හෝ දැන දැනම සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු ඕනෑ කමින් යටපත් කර ඇති බව හෝ අනාවරණය වුවහොත් සේවයෙන් පහ කෙරෙනු ඇත.

14. අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අදාල කරුණු හෝ එම නිවේදනයෙන් අනාවරණය නොවන වෙනත් කරුණු සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ.

15. මෙම විභාගය පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම් කිරීම/නොකිරීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳ අවසාන තීරණය වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය. එමෙන්ම මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති කිසියම් කරුණක් වෙතොත් ඒ පිළිබඳ අවසාන තීරණය ද වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු ය.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

කාන්ති වේහැල්ල,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2015 මැයි මස 11 වැනි දින,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (වයඹ),
පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල.

ආදර්ශ අයදුම්පත්‍රය

***වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ආධුනික භෛෂජ්ජක තනතුර (පුහුණු කිරීමේ ශ්‍රේණියට) බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2015***

විභාග අංකය : [ ]

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය [ ]
සිංහල - 2, දෙමළ -3, ඉංග්‍රීසි - 4

01. 1.1 මුල ්කුරු අගට යොදා මුල ්කුරු සමග නම :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA A. B.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.)

1.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.6 ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1 පුරුෂ - 0) [ ]
(අදාල අංකය කොටුව තුල ලියන්න)

1.7 විවාහක/අවිවාහක බව :————. [ ]
(අවිවාහක - 1 විවාහක - 2)

1.8 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

02. 2.1 2015.06.30 දිනට වයඹ පළාතේ ස්ථිර පදිංචිය :

අවුරුදු :————, මාස :————, දින :————.

2.2 දුරකථන අංකය : පෞද්ගලික :————. නිවස :————.

03. උපන් දිනය :

වර්ෂය :————, මාසය :————, දිනය :————.

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2015.06.30 දිනට වයස :

අවුරුදු :————, මාස :————, දින :————.

3.2 ශ්‍රී ලංකාවේ පුරවැසියකු වන්නේ උපතින් ද?/ලියාපදිංචි වීමෙන් ද ? :—————.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :*

4.1 අ.පො.ස. (සා. පෙළ) විභාගය :

*පළමුවර :*

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |

*දෙවන වර :*

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයය* | *ලබා ඇති සාමාර්ථය* |
|---|---|
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |
| ........................................ | ........................ |

4.2 අ.පො.ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය සහ නව විෂයය නිර්දේශය පැරණි නිර්දේශය යටතේ ද යන වග :—————.

(i) විභාග අංකය :—————.

| (ii) විෂයය | ලබා ඇති සාමාර්ථය |
|---|---|
| ............................................ | ........................ |
| ............................................ | ........................ |
| ............................................ | ........................ |
| ............................................ | ........................ |

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :—————.
දිනය :—————.
ලදුපත් ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :—————.

(ලදුපත මෙම කොටුව තුළ නොගැලවෙන සේ අලවන්න)

06. *අයදුම්කරුගේ සහතිකය :*

.......................................... වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක................ හා ............................. වැනි දින දරන ලදු පත මෙහි අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව හා නුසුදුස්සකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයට මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බවද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන................................. මයා/මිය/මෙනවිය, මා පෞද්ගලික හඳුනන බවත්, ඔහු/ඇය........................ දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන අයගේ නම :—————.
අත්සන :—————.
තනතුර හා නිල මුද්‍රාව :—————.

(මෙම සහතිකය රජයේ විදුහලක විදුහල්පතිවරයකු/සමාදාන විනිශ්චයකාරවරයකු/දිවුරුම් කොමසාරිස්වරයකු/නීතිඥයකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන, ස්ථිර තනතුරක් දරන රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.)

**රජයේ හෝ පළාත් සභා රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය**

(අනවශ්‍ය වචන කපා හරින්න.)

...................................................... මයා/මිය/මෙනවිය දැනට.................................. අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ................................. වශයෙන් ස්ථිර සේවයේ යෙදී සිටින බවත්, ඔහුගේ/ඇයගේ සේවය සතුටුදායක බවත්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහකර හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් ආකාර්යක්ෂමතාව මත විශ්‍රාම ගන්වා ඇති/නැති බවත්, තනතුර අතහැර ගිය අයකු සේ සලකා ඇති/නැති බවත් සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරින් නිදහස් කළ හැකි ය./නොහැකි ය.

—————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තබන්න)

දිනය :—————.

05-687

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.